# තනතුරු පුරප්පාඩු

## නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

## අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

## අධ්‍යක්ෂ ජනරාල් තනතුර

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වයස අවුරුදු 55 ට අඩු පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරු නායකත්ව ගුණාංගයන්ගෙන් හෙබි ගතික භාවයෙන් යුතු, කැපවීමක් ඇති පුද්ගලයෙකු විය යුතු අතර, රාජ්‍ය භාෂා අතුරින් එකක් හා ඉංග්‍රීසි භාෂාව හැසිරවීම සම්බන්ධයෙන් විශිෂ්ඨ සන්දේශන හැකියාවක් ඇති අයකු විය යුතුය.
මෙම තනතුර ජ්‍යෙෂ්ඨ කළමනාකාරණ HM 2-1 කළමනාකාර සේවා චක්‍රලේඛ 02/2016(1) ට අනුව රු. 91,645 – 12x2,700 – 124,045/- වැටුප් පරිමාණය හිමිවේ. 2017 වර්ෂයේ මූලික වැටුප රු. 63,076/-කි. මෙම තනතුර ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය. මෙම තනතුරට රාජ්‍ය අංශයේ සමාන තනතුරුවලට හිමි වරප්‍රසාද හිමිවේ.

දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින්ද ද්විතීය පදනම මත බඳවාගැනීමද සලකා බැලේ.

**සුදුසුකම් (පහත 1 හෝ 2) - බාහිර අයදුම්කරුවන්**

**(1)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ ජනසන්නිවේදනය/ කළමනාකරණය/ සමාජවැඩ/ නීතිය/ වාණිජවේදී/ රසායනවිද්‍යාව/ ගිණුම්කරණය/ තොරතුරු තාක්ෂණය/ සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

**සමඟ**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, පශ්චාත් උපාධියක් ලබාතිබීම/ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත / මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 20 ක පළපුරුද්දක් තිබිය යුතු අතර අවම වශයෙන් මින් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.

**හෝ**

**(2)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ මනෝවිද්‍යාව/ ජනසන්නිවේදනය / කළමනාකරණය/ සමාජ වැඩ/ නීතිය/ වාණිජවේදී/ රසායන විද්‍යාව/ ගිණුම්කරණය/ තොරතුරු තාක්ෂණය / සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබාතිබීම.

**සමඟ**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ආචාර්ය උපාධියක් ලබාතිබීම.

**සහ**

ඉහත සඳහන් ආචාර්ය උපාධිය ලබාගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 05 ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්දක් තිබීම.

**බඳවා ගැනීමේ පරිපාටිය**

ඔබගේ තොරතුරු “A4” ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් පිටුවේ: (www.nddcb.gov.lk) සඳහන් ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමඟ **2017.07.23** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් **සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය** යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ/සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරින් තම අයදුම්පත් ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතුය. අසම්පූර්ණ හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.